ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023-01-09

පැමිණිලි පාර්ශවය : ඕ. එස්. ඩී. පෙරේරා මිය.
7/ඒ1/15, සියනෑ උයන,
යක්කල.

වගඋත්තර පාර්ශවය : පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
අංක : 02, කේම්බ්‍රිජ් ටෙරසය,
කොළඹ 07.

<u>පැමිණිලි අංකය :- HRC/4593/13</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, දැනට මහර ප්‍රාදේශීය සභාවේ කළමණාකාර සහකාරවරියක ලෙස සේවය කරන තමාට 2013.11.19 දිනැතිව ස්ථානමාරු නියෝගයක් (ගම්පහ ප්‍රාදේශීය සභාවේ සිට) ලබාදුන් බවත්, තමාගේ කිසිදු ඉල්ලීමකින් හෝ කිසිදු දැනුම්දීමකින් තොරව ක්ෂණිකව තමාට ස්ථානමාරුවීම ලබාදුන් බවත්, ඒ තුළින් තමා අපහසුතාවයකට පත් වූ අතර, ස්ථානමාරු කිරීම සඳහා කිසිදු හේතු දැක්වීමක් සිදු නොකළ බවත් තමා මේ පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කළද මේ දක්වා ඒ පිළිබඳව කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත්ය.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

වගඋත්තර පාර්ශවය විසින් මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින්, මෙම පැමිණිලිකාරිය 2008.02.15 දින සිට ගම්පහ ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සහකාරවරියක් ලෙස සේවය කරන බවත්, එම ප්‍රාදේශීය සභාවේ සේවය කරන ලද මෙම නිලධාරිනිය සහ තවත් නිලධාරිනියන් දෙදෙනෙකු විසින් ප්‍රදේශීය සභා කාර්යාලය තුළ රාජකාරි කාල සීමාවේදී නොමනා හැසිරීම්වල යෙදෙනා බව වාර්තා වූ බවත්, ඊට අදාළව 2013.11.18 වන දින ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් ලිඛිතව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

කරුණු වාර්තා කළ බවත් 2013.11.19 වන දින ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින්ද මෙම පැමිණිලිකාරිය හා අනෙක් නිලධාරීන් දෙදෙනා එම කාර්යාලයෙන් බැහැරව ස්ථානමාරු කිරීමට ඉල්ලීම් කළ බවත්, එවන් තත්වයක් යටතේ අදාළ නිලධාරිනියන් සම්බන්ධයෙන් පරිපාලන වශයෙන් තීරණයක් ගැනීමේ අවශ්‍යතාවය අනුව වාර්තා වූ කරුණු වලට අදාළව විනය ක්‍රියාමාර්ගයක් දක්වා ව්‍යාප්ත කිරීමකින් තොරව ආසන්න ස්ථාන මාරුකිරීම සුදුසු බව තීරණය කර මාරුකිරීම කළ බවත් දක්වා ඇත. බස්නාහිර පළාත තුළ සේවය කිරීමට එකඟතාවය පළ කරමින් පත්වීම ලබා ඇති නිසාත් සාධාරණම ක්‍රියාමාර්ගය වශයෙන් සේවය කළ ස්ථානයට ආසන්නතම බලප්‍රදේශයේ පළාත් පාලන ආයතනයක් වෙත මෙම ස්ථානමාරුවීම ලබා දුන් බවත්, ඇය විසින් එම මාරුවීම් අභියාචනය කරමින් ගම්පහ මහ නගර සභාවට ස්ථානමාරුවීම් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටියද එහි පුරප්පාඩු නොමැති වීම තුළ ස්ථානමාරු නොකළ බවත් දක්වා ඇත.

තවදුරටත් වගඋත්තරකරු දන්වා ඇත්තේ, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ පැමිණිලි වලට අදාළව කරුණු විමසීමක් පැමිණිලිකාරිය වෙතින් සිදු කරන්නට යෙදී නොමැති බව වගඋත්තරකරු පිළිගන්නා බවයි. ලිපි ගොනුව අනුව ඇයගේ සේවා කාලය තුළ පූර්ව අවවාද කිරීම් හෝ වෙනත් විනය ක්‍රියාමාර්ගයකට නතු කිරීමට කටයුතු යෙදී නොමැති බව ද පිළිගෙන ඇත.

**විමර්ශනය :-**

පැමිණිලිකාරිය මූලිකව පැමිණිල්ලෙන් දක්වා ඇත්තේ, තමාව අත්තනෝමතිකව ස්ථානමාරු කිරීම තුළින් තමාට නීතියේ රැකවරණය සර්ව සාධාරණව නොලැබුනු බවයි. ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් සිදු කළ ස්ථානමාරුවීම කෙරෙහි අවධානය යොමු කිරීමේදී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය වී ඇත.

1. පැමිණිලිකාරියට ස්ථානමාරුවීම ලබාදීමට හේතු වී ඇත්තේ, පැමිණිලිකාරිය ඇතුළු අනෙකුත් නිලධාරිනියන් දෙදෙනා අන්‍යයට හා සේවා ලාභීන්ට ආදර්ශමත් නොවන ආකාරයේ හැසිරීම් හා ඒ තුළින් ආයතනය මහජනතාව අතර ඇති සුහදශීලි සම්බන්ධය ගොඩනැගීමට ඇති අපහසුව බවයි.

2. ඊට අදාළව 2013.11.18 දින ගම්පහ දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් ලිඛිතව කරුණු දැක්වීමත්, 2013.11.19 දිනැතිව ගම්පහ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් සිදු කළ ලිඛිත ඉල්ලීමත් අනුව පළාත් පාලන කොමසාරිස්වරයා විසින් 2013.11.19 වන දිනැතිව ස්ථානමාරුවීම් කර ඇති බව නිරීක්ෂණය වේ.

3. එසේම ස්ථානමාරුවීම් කිරීමට හේතු වූ කාරණය පිළිබඳව පැමිණිලිකාරිය වෙතින් කිසිදු විටක කරුණු විමසීමක් සිදු නොකළ බව මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ වගඋත්තර පාර්ශවය විසින් පිළිගෙන ඇත.

4. පැමිණිලිකාරිය සම්බන්ධව මීට පෙර කිසිදු අවස්ථාවක ස්ථානමාරු කිරීමට අදාළ වූ කරුණු සම්බන්ධව වාචිකව හෝ ලිඛිතව අවවාද කිරීමක් හෝ දැනුම්දීමක් කර නොමැති බවද වගඋත්තර පාර්ශවය පිළිගෙන ඇත.

ඒ අනුව ඉහත සඳහන් සියලුම කරුණු සැළකිල්ලට ගැනීමේදී ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය වන ආකාරයට අත්තනෝමතික ලෙස මෙම ස්ථානමාරුවීම් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙහිදී 2013.11.18 හා 2013.11.19 වන දිනැති කරුණු දැක්වීමට අදාළව එදිනම ස්ථානමාරු කිරීම තුළින් එම ක්‍රියාව තවදුරටත් තහවුරු වේ.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් පැමිණිලිකාරිය වෙතින් කරන ලද විමසීමකදී පැමිණිලිකාරිය විසින් දන්වා ඇත්තේ, මේ වන විට තමා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉවත්ව සේවය කරන බවයි.

**නිගමනය :-**

උක්ත කරුණු අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති නීතියේ රැකවරණය සර්ව සාධාරණව පැමිණිලිකාරිය වෙත ලැබී නොමැති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙම පරීක්ෂණයෙන් පසුව නිගමනය කරනු ලැබේ.

කෙසේ වෙතත්, මේ වන විටත් පැමිණිලිකාරිය වගඋත්තරකාර ආයතනයේ සේවයේ නියුතුව නොමැති බැවින්, අදාළ ස්ථාන මාරුවීම සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කිරීමේ හැකියාවක් නොමැත.

**නිර්දේශය :-**

වඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින් ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමටත් වඩාත් විනිවිධභාවයකින් යුතුව කටයුතු කිරීමටත් වගඋත්තරකාර පාර්ශවය වගබලා ගත යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලබන අතර,

මහර ප්‍රාදේශීය සභාවේ වගකිවයුතු නිධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට අමාත්‍යාංශ ලේකම්වරයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

2023. 02.24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmugan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මා.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා,
පළාත් පාලන අමාත්‍යාංශය,
අංක 204, බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,
10 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

02. අමාත්‍යාංශ ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය,
අංක 204, බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය,
10 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

B/-